# ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ස්ථාපිත කිරීම: එහි ස්වභාවය හා පරිණාමය පිළිබඳ අධ්‍යයනයක්

1708 සිට 1948 දක්වා

අජන්තා හපුආරච්චි,
ජනමාධ්‍යවේද ඒකකය,
කොළඹ විශ්වවිද්‍යාලය,
ශ්‍රී ලංකාව.

ප්‍රවේශ අංකය 232
වර්ග අංකය

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පිළිබඳ දර්ශන විශාරද
උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන නිබන්ධයයි.
2001 ජනවාරි

# නිබන්ධ සාරාංශය

"ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ස්ථාපිත කිරිම එහි ස්වභාවය හා පරිණාමය" පිළිබඳ ව කෙරුණු මේ පර්යේෂණයේ දී මුද්‍රණ ශිල්පය යන්ත අර්ථ දක්වා ඇති ලෙසට එය තාක්ෂණය හා බැඳි පවතින්නකි. මානව පරිණාමයේ දී ශිෂ්ටාචාරය සමඟ සමාන්තර ව බිහි ව වැඩී ආ මුද්‍රණ ශිල්පය මිනිස් බුද්ධියේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. මුද්‍රණ ශිල්පය පිළිබඳ ව ශ්‍රී ලංකාවේ මෙතෙක් කරනු ලැබ ඇති බොහෝ අධ්‍යයනයන් මඟින් පෙන්වා දී ඇත්තේ එහි ආරම්භය හා ක්‍රියාවලිය පිළිබඳ ව වන අතර ඒ හා බැඳුණු පරිපූර්ණ සමාජ සන්නිවේදනාත්මක අධ්‍යයනයන් සිදු කොට ඇත්තේ සීමාසහිත ව ය. මේ නිබන්ධයෙන් එ කී සීමාසහිත අධ්‍යයනයන් යම් පරිපූර්ණ භාවයකට පත් කිරීමක් අපේක්ෂිතය.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පයේ ආරම්භය පිළිබඳ ව පැන නැඟෙන ප්‍රධාන ප්‍රශ්න දෙකක් මෙහි දී හඳුනාගනු ලැබ ඇත. එ නම් ලන්දේසි ජාතිකයන් මෙරට මුද්‍රණශිල්පය ස්ථාපිත කිරීමට පෙර පෘතුගීසීන් ශතවර්ෂ දෙකකට ආසන්න කලක් විවිධ පළාත්වල ආර්ථික, දේශපාලන හා පරිපාලන කටයුතුවල යෙදුණු අතර ඔවුන් විසින් ඉන්දියාවේ ගෝවේ මුද්‍රණාලයක් ද පිහිටුවනු ලැබ තිබූ මුත් ශ්‍රී ලංකාවේ එවැන්නක් පිළිබඳ අදහසක් නොතිබුණේ මන්ද යන්න මේ අධ්‍යයනයෙන් ගවේෂණය කොට ඇත. ඒ පසුබිම යටතේ ලන්දේසීන්ට මෙරට මුද්‍රණ ශිල්පය ස්ථාපිත කිරීමට හැකි වූ සමාජ විද්‍යාත්මක සාධක ගවේෂණය කිරීම මේ පර්යේෂණයේ මෙහෙයුම් ආකෘතිය **(Guiding Model )** වේ.

ඒ සඳහා වූ ක්‍රමවේදයේ පළමු වැන්න ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය යි. මෙරට මුද්‍රණ ශිල්පය ස්ථාපිත කිරීම හා බැඳි ප්‍රවණතා හා ජනතා ආකල්ප හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය (පාඨක සමීක්ෂණය) ක්‍රමවේදයේ දෙවන ප්‍රභේදය ලෙස යොදාගෙන තිබේ. ශ්‍රී ලංකාවේ දැනට අර්බුද පවත්නා දිස්ත්‍රික්ක හැර අන් සියල්ල ආවරණය කරගත හැකි විය. එහි දී අතීත මුද්‍රණ ශිල්පය ආශ්‍රිත ජනතා ආකල්ප සමීක්ෂණයක් මඟින් සොයාගැනීම අසීරු වූ බැවින් යළි දූ පර්යේෂණ මාතෘකාව හා සමීප විද්වතුන් ගෙන් මත විමසුමක් කරගැනීමට සිදු විය.

පුරාවිද්‍යාත්මක , සමාජ විද්‍යාත්මක හා වාග් විද්‍යාත්මක මෙන් ම සන්නිවේදන විද්‍යාත්මක ව ද කරුණු ගවේෂණය කොට ඇත. මෙතෙක් විද්වතුන් ගේ සාකච්ඡාවට භාජනය නුවූ"ස්වදේශිකත්ව සංකල්පය" මවිසින් ගොඩ නගන ලද්දක් වූ අතර ඒ ඔස්සේ "මුද්‍රණය" සඳහා වූ සාම්ප්‍රදායික නිර්වචන අද්‍යතනයේ වෙනස් වූ අන්දම පෙන්වා දී තිබේ.

එසේ ම ස්වදේශිකත්ව සංකල්පය භාවිත වූ විෂය ක්ෂෙත්‍රවල දී දියුණු අක්ෂර පරිණාමයක් මෙන් ම "දේශීය" ලේඛන න්‍යාය ද හඳුනාගත හැකි වී තිබේ. එන මී හසුන, ලියුම, ලියුම් කොළය, සන්නස සන්දේශය ආදි ප්‍රාථමික ලේඛන ක්‍රම හා විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කළ බව හඳුනාගත හැකි වීම යි. එහි දී මුද්‍රණ ශිල්පය හා සමීප පුරාවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක තොරතුරු ඔස්සේ බලන කල කාසි මුද්‍රණය ආදි කරුණු අනුව මෙරට මුද්‍රණ ශිල්පය හා සමීප ඇතැම් ශිල්පීය ක්‍රම තිබුණු බවට තොරතුරු ලැබේ.

අතීතයේ පැවැති මානව සබඳතා අනුව විනය ප්‍රමුඛ ඇත පෙරදිගින් ආරම්භ වී යුරෝපා රටවල දී කාර්මීකරණයට භාජනය වූ මුද්‍රණ ශිල්පය පෙරළා ඒ රටවල් විසින් ම ඈත පෙරදිගට හඳුන්වාදීම පිළිබඳ ව කරුණු කීපයක් පෙන්වා දී තිබේ.

ඈත පෙරදිග බොහෝ රටවල රාජ පක්ෂපාතිත්වය හා රාජ්‍ය අනුග්‍රහය මත පැවැති මුද්‍රණ තාක්ෂණය රාජ්‍ය අනුග්‍රහය හීන වීමත් සමග අඩාල වී ඇත. ඒ තාක්ෂණය යුරෝප ජාතීන් විසින් කාර්මීකරණයට හසු කොට ඈත පෙරදිගට පෙරලා හඳුන්වාදීමේ දී ශ්‍රී ලංකාවට ද ඒ ආභාසයෙන් මුද්‍රණ ශිල්පය ලද හැකි විය .

ශ්‍රී ලංකාවට මුද්‍රණ ශිල්පය හඳුන්වාදීම හා බැඳි සාධනීය ලක්ෂණ අතර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, ජාතික ව්‍යාපාර හා ආගමික ව්‍යාපාර අන්‍යෝන්‍ය වශයෙන් මුද්‍රණ ශිල්පයේ ප්‍රවර්ධනයටත් සමාජ ප්‍රගමනයටත් හේතු වූ බව පෙන්වා දී තිබේ.

පෘතුගීසීන් ගේ මුඛ්‍ය පරමාර්ථ අතර මෙරට මුද්‍රණය පිළිබඳ අදහසක් ඔවුන් තුළ නොවූ බවත්, අතීත ශ්‍රී ලාංකික සමාජයේ මුද්‍රණයට සමීප ඇතැම් මුද්‍රා විශේෂ තිබෙන්නට ඇති බවත්, වර්තමානයේ එය ලෝකයේ දියුණු මුද්‍රණ තත්ත්වයට සමාන ව වර්ධනය වී ඇති බවත් පෙන්වා දී තිබේ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ස්ථාපිත කිරීම එහි ස්වභාවය හා පරිණාමය පිළිබඳ ව කෙරුණු මේ පර්යේෂණය මඟින් අතීත මානව සබඳතා, අන්තර්සංස්කෘතික සබඳතා හා නවීන මුද්‍රණ තාක්ෂණය හා බැඳි ඇති අයුරු හඳුනාගත හැකි ය.

# Abstract

Printing in terms of its definition is intimately connected with technology . In accordance with that ,this is a study of the establishment of printing in Sri Lanka; it's nature and evolution. Printing which evolved along with the emergence of man into civilized existence, is the result of collective invention of man. Several studies have been done about the origin and process of printing in Sri Lanka ,but those have been only a very limited attempt at making a study of the total social communication associated with printing. The purpose of this study is to overcome the limitations of previous studies.

This thesis has identified two major issues that arise in relation to the origin of printing in Sri Lanka. Before the establishment of printing in Sri Lanka by the Dutch ,the Portuguese in their administration of this country were engaged in political, economic and social activities for nearly two centuries. They had set up a printing press in Goa in India. This study will explore why the need for printing in Sri Lanka did not arise under the Portuguese.

The Guiding Model of this study is the investigation of the social structure and the scientific background that enabled the Dutch to establish printing in Sri Lanka. The first segment of the methodology is the study of the primary and secondary sources. The second category of the methodology is field research (Readership survey) to identify the attitudes of the masses .But in this study it was not possible to identify people's attitudes through a survey. In this survey, it has been possible to cover all the Districts other than those affected by the ethnic conflicts.

In consequence, it was necessary to obtain opinions of experts in this field. In this context research has been conducted in terms of Archaeological, sociological, Linguistics and communicational factors. I have introduced anew the concept, I describe as the **"Indigenous attitude"**. In terms of that I have indicated how the definition of printing has undergone changes today, discarding the traditional definition.

In the fields where the indigenous attitude had operated it has been possible to identify an advanced evolution of orthography. This can be concluded by the recognition of the existence of decree ,letter, letter paper, grant documents and messages. These are fundamental forms of written communication. It has also been possible to establish the fact that various forms of communication had also been in use.

When we examine the situation in terms of printing technology and archaeological and sociological information associated with printing technology we have been able to conclude that there were certain technologies closely related to printing. Here the study of numismatics is specially useful. Several facts have been introduced regarding the entry of printing to Far-Eastern countries from Europe which acquired the technique of printing from such Far-Eastern counties as China, before it was mechanized in European countries. In many countries in the far-east technology of printing existed on the loyalty to rulers and royal patronage.

When those diminished printing technology deteriorated. When the printing technology was mechanized and re- introduced to the Far-East by European nations , Sri Lanka too was able to obtain printing through that process.

When we consider the factors relating to the introduction of printing to Sri Lanka, we can observe that education, national movements, and religious movements contributed towards the progress of printing in this country. The Portuguese did not have among their priorities, the issue of printing in Sri Lanka. We can also surmise that there have been some systems of seals somewhat related to printing in ancient Sri Lanka. Some of these have evolved today almost to the level of advanced printing techniques in the modern world. This research thesis dealing with the establishment of printing in Sri Lanka ,its nature structure and evolution has recognized the manner in which the modern printing techniques have linked up with age-old human relations and inter-cultural associations.